**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ("බැංකුව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිලිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අනුගත වීම හේතුවෙන් අතිරේක ගණනය කිරීම් පැනනගී. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට සම්බන්ධ සටහන් පොදු ලෙජරයට ගැලපීමකින් තොරව සෘජුවම මූල්‍ය ප්‍රකාශන වලට සටහන් පැනවීම. | විගණකවරුන් විසින් මතු කරන ලද නිරීක්ෂණ හේතුවෙන් සිදුවන වෙනස්කම් වලට යටත්ව ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අදාළ අමතර කටයුතු කාර්තුමය හා වාර්ෂිකව සිදු කෙරේ. කෙසේ වෙතත්, එම ගැලපීම් කාර්තුමය සහ වාර්ෂිකව අදාළ මූල්‍ය ප්‍රකාශනවල හිස්තමය ලෙස සකස් කරනු ලැබේ. විගණනය අවසන් වූ පසු, සියලුම ඇතුළත් කිරීම් පොදු ලෙජරය වෙත සටහන් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| II. මධ්‍යම වගකීම් වාර්තාවක් නොතිබීම, තනි පුද්ගල සැලකිය යුතු පාරිභෝගිකයින් සඳහා සමාලෝචන ක්‍රියාවලියක් නොතිබීම හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලියේ සඵලතාවයට බාධාවක් විය හැකි අතර තවදුරටත් වැඩිදියුණු කිරීම් අවශ්‍යවේ. | අභ්‍යන්තරව සංවර්ධිත මධ්‍යගත වත්කම් සහ වගකීම් වාර්තාවක් එම්අයිඑස් පද්ධතියට එක් කර ඇත. හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලිය තනි තනිව සැලකිය යුතු ණයවලට අදාළ ශාඛාවලින් ලැබෙන දත්ත මත පදනම්ව සිදු කෙරේ. | හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය නිරීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| III. විගණන සොයාගැනීම් මත නිතර ගැලපීම් සිදු කිරීම සහ විගණනයේ දී මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල පවතින වැරදි සහ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන බැංකුවේ වෙනම අංශයක් විසින් සමාලෝචනය නොකිරීම ප්‍රධාන වශයෙන් එම දෝෂවලට හේතු විය. | එය 2024 සිට අලුතින් බඳවාගත් සහකාර සාමාන්‍යාධිකාරීවරයා වෙත පැවරෙනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය ස්වාධීනව සත්‍යාපනය කිරීමට සහ සහතික කිරීමට ඵලදායී පාලනයක් ඇති කිරීම. |
| IV. එකම විස්තරය යටතේ පොදු ලෙජර ගිණුම් කිහිපයක් බැංකුව විසින් නිර්මාණය කර ඇති අතර එමගින් අදාළ ලෙජර ගිණුම්වලට සටහන් ඇතුලත් කිරීමේදී ව්‍යාකූල වේ. තවද, සමහර ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සෘණ ශේෂයන් නිරීක්ෂණය විය. | තොරතුරු තාක්ෂණ අංශය සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ ලෙජර් ගිණුම්වල ගැටලු විසඳීමට කටයුතු කරනු ඇත.<br>තවද, පද්ධති ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ ගැටළු හේතුවෙන් සමහර ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සෘණ ශේෂයන් පවතී. සීබීඑස් විකුණුම්කරු සහාය ඇතිව මෙම ගැටළුව විසඳනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

### 1.5.2. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| I. 2023 දෙසැම්බර් 31 දිනට ණය ප්‍රධාන ගොනුවට අනුව ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශය වල සටහන් අංක 21 ට අනුව ශේෂයන් අතර, ලැබිය යුතු අවසාන ණය ශේෂය හා ලැබිය යුතු පොලී සම්බන්ධයෙන් රු. 46,401,371ක වෙනසක් නිරීක්ෂණය කරන ලදී. ඇමුණුම 1 හි විස්තර දක්වා ඇත. | මෙම ගැටළුව නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා ගිණුම් සැසඳුම් කිරිමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| II. 2023 දෙසැම්බර් 31 දිනට කල්බදු (හස්තමය) ප්‍රධාන ගොනුවේ සහ පොදු ලෙජර් ශේෂයේ හිඟ ශේෂයන් අතර රුපියල් 47,047,552 ක වෙනසක් නිරීක්ෂණය විය.<br>**විස්තරය** — **31/12/2023 දිනට ශේෂය (රු.)**<br>කල්බදු (හස්තමය) ප්‍රධාන ගොනුවේ ශේෂය — 49,010,790<br>පොදු ලෙජර් ශේෂයන් — 96,058,342<br>වෙනස — -47,047,552 | බැංකුවේ ලීසිං අංශයේ අදාළ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් වෙනස ඉවත් කර ගැනීමට සහ 2024 දෙසැම්බර් 31 දිනට පෙර වෙනස සමථයකට පත් කිරීමට කටයුතු කරනු ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා ගිණුම් සැසඳුම් කිරිමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| III. 2023 දෙසැම්බර් 31 දිනට "අක්‍රීය ණය සඳහා අවිනිශ්චිත පොලී " පොදු ලෙජර ගිණුමට අදාළව (පොදු ලෙජර අංක 230110105), පොදු ලෙජරයට අනුව ශේෂය සහ ශේෂ පිරික්සුම අනුව ශේෂය අතර රු.42,429,586 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් , මෙම වෙනස පද්ධතියට ඇතුළු නොකර හස්තමය ලෙස පවත්වාගෙන යාම කර ඇත. | මෙම ගැටළුව නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සැසඳුම් කිරිමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| විස්තරය | 31/12/2023 දිනට ශේෂය (රු.) |
|---|---|
| පොදු ලෙජර් ශේෂය 230110105 | 7,885,042,851 |
| ශේෂ පිරික්සුම අනුව ශේෂය | 7,927,472,437 |
| වෙනස | 42,429,586 |

| | | | |
|---|---|---|---|
| IV. | 2023 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් වන අක්‍රීය ණය සඳහා අවිනිශ්චිත පොලී සහ ලැබිය යුතු පොලී ශේෂයන් අතර රු.16,708,833 ක වෙනසක් ණය හිමියන්ගේ ගිණුමට (GL අංකය: - 230165100) මාරු කර ඇති බව නිරීක්ෂණය වී ඇත, | පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් වලට අදාළ පොදු ලෙජර් ගිණුම් ශාඛා මට්ටමින් පවත්වාගෙන යන අතර ගනුදෙනු වාර්තා කිරීමේ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සියලුම පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් කාලානුරූපව සැසඳුම් කළ යුතුය. එබැවින්, වසර අවසාන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී ණයගැතියන් හෝ ණයහිමියන් ලෙස වෙනස්කම් සටහන් වීම වැළැක්වීම සඳහා කාලීනව පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් සැසඳුම් කිරීම ට ශාඛා වෙත දැනුම් දීමට මූල්‍ය අංශය කටයුතු කරනු ඇත. තවද, පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම්වලට අදාළ වෙනස්කම්, මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා පමණක් ශේෂ පිරික්සුමේ නාමික ප්‍රවේශයන් ලෙස වසර අවසාන මූල්‍ය | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ණය හිමියන්ගේ පාලන ගිණුම සැසඳුම් කිරීමට සහ අදාළ ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශනවලදී ණය ගැතියන් හෝ ණය හිමියන් ලෙස සටහන් කර ඇති අතර ඒවා පොදු ලෙජර් වෙත පිහිටුවා නොමැත. | |
| V. | 2023 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් වන අක්‍රීය ණය සඳහා අවිනිශ්චිත පොලී (කල්බදු) කොවිඩ් 19- (GL අංකය: - 230110127) සහ ලැබිය යුතු පොලී (කල්බදු) GL No. – 130120116)ශේෂයන් අතර රු. 5,898,846 ක වෙනසක් ණය ගැතියන්ගේ ගිණුමට (GL අංකය: - 140105105) මාරු කර ඇති බව දක්නට ලැබේ. | පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් වලට අදාළ පොදු ලෙජර් ගිණුම් ශාඛා මට්ටමින් පවත්වාගෙන යන අතර ගනුදෙනු වාර්තා කිරීමේ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සියලුම පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් කාලානුරූපව සැසඳුම් කළ යුතුය. එබැවින්, වසර අවසාන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී ණයගැතියන් හෝ ණයහිමියන් ලෙස වෙනස්කම් සටහන් වීම වැලැක්වීම සඳහා කාලීනව පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම් සැසඳුම් කිරීම ට ශාඛා වෙත දැනුම් දීමට මූල්‍ය අංශය කටයුතු කරනු ඇත. තවද, පොදු ලෙජර් ප්‍රතිවිරුද්ධ ගිණුම්වලට අදාළ වෙනස්කම්, මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා පමණක් ශේෂ පිරික්ෂුමේ නාමික ප්‍රවේශයන් ලෙස වසර අවසාන මූල්‍ය ප්‍රකාශනවලදී ණය ගැතියන් හෝ ණය | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ණය ගැතියන්ගේ පාලන ගිණුම සැසඳුම් කිරීමට සහ අදාළ ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| | | |
|---|---|---|
| | හිමියන් ලෙස සටහන් කර ඇති අතර ඒවා පොදු ලෙජර් වෙත පිහිටුවා නොමැත. | |
| VI. 2023 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ ශාඛාව ලබාදුන් ප්‍රධාන ගොනුවට අනුව ලැබිය යුතු උකස් ණය පොලී ශේෂයන් සහ පොදු ලෙජර අනුව පහත ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. විස්තර පහත දක්වා ඇත.<br>**විස්තරය** — **31/12/2023 දිනට ශේෂය (රු.)**<br>තොරතුරු තාක්ෂණ ශාඛාව ලබාදුන් ප්‍රධාන ගොනුවට අනුව ලැබිය යුතු උකස් ණය පොලී ශේෂයන් — 4,104,398,724<br>පොදු ලෙජර අනුව ලැබිය යුතු උකස් ණය පොලී ශේෂයන් (කේතය පටන්ගැන්ම 126..,127….,129….,130….) — 4,074,048,809<br>වෙනස — 30,349,915 | ගිණුම නොවිසඳී පවතින අතර, ශාඛා උකස් අත්තිකාරම් සඳහා අර්ධ පොලී ගෙවීම් පිළිගනී. මෙම අවස්ථා වලදී ගිණුම් ඇතුළත් කිරීම් නිවැරදිව සකසනු ලැබේ. ගිණුම වසා දැමූ විට ඉතිරි පොලියත් නිවැරදිව අයකර ගනී. කෙසේ වෙතත්, මෙම අර්ධ ගෙවීම් පිළිබිඹු කිරීමට උකස් මාස්ටර් ලැයිස්තුව යාවත්කාලීන නොවේ. මේ ප්‍රශ්නය නිවැරදි කරන්න කටයුතු කරනවා. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සැසඳුම් කිරීමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| VII. යූඑන්ඩීපී-ආර්යූර්ඩීඒ ඇපකර අරමුදල<br>රුහුණු ආර්ථික සංවර්ධන නියෝජිතායතනය (ආර්යූර්ඩීඒ) විසින් ණය ඇපකර අරමුදලක් ලෙස රුපියල් 34,124,900ක් 2009 දී බැංකුවට ලබාදී තිබුණි. 2013 වර්ෂයේදී බැංකුව රුපියල් 23,121,157 ක ආපසු ගෙවීමක් කර ඇති අතර ඉතිරි මුදල රුපියල් 11,003,743 ක් මේ දක්වා වගකීමක් ලෙස පවත්වාගෙන ගොස් ඇත.<br>2020 මැයි 18 දිනැති අභ්‍යන්තර සංදේශ අංක RDB/SP/FC/8/49 අනුව ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී-දකුණු පළාත් විසින් ප්‍රධාන මූල්‍ය නිලධාරි (සීඑෆ්ඕ) | නිර්දේශ ලබා ගැනීම සඳහා ඒඑල්සීඕ වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර ALCO විසින් ලබා දෙන තීරණය අනුව ගැටළුව නිවැරදි කරනු ලැබේ. | පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට ගිණුම් සැසඳුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

වෙත ආර්යූර්ඩීජ් විසුරුවා හැර ඇති බැවින් ආර්යූර්ඩීජ් හි පොලී ප්‍රතිපාදන ලෙස වෙන්කර ඇති රු.23,607,260 ක් ලාභයට ගලපන ලෙස ඉල්ලා ඇත. කෙසේ වෙතත්, ලාභ හා අලාභට ගැලපිය යුතු පොලී වටිනාකම හඳුනා ගැනීමට බැංකුව මේ දක්වා කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

### 1.5.3. විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පීර්ජ්සීර් ව්‍යාපෘතිය - පොදු ලෙජර 220105150**<br>2023 දෙසැම්බර් 31 දිනට පීර්ජ්සීර් ව්‍යාපෘති අරමුදලේ පොදු ලෙජර ශේෂය රුපියල් මිලියන 44 කි. මෙම මුදල 2015 වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. නිරීක්ෂණයට අනුව, ගම්වාසීන්ගේ සහ ගොවි සංවිධානවල ආදායම් උත්පාදන කටයුතු සඳහා ආධාර සැපයීම සඳහා ජපන් අන්තර්ජාතික සහයෝගීතා බැංකුවෙන් (ජේබීඅයිසී) සෑම වසරකම සියයට 2ක පොලී ප්‍රතිශතයක් යටතේ රුපියල් මිලියන 44 ක් ලැබී ඇත. කෙසේ වෙතත්, ප්‍රදාන මුදල අපේක්ෂිත අරමුණට යෙදවීම සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් සපයා නොමැත. | මිලියන 44 න් රු. මිලියන 7.5 ක් දැනටමත් භාවිතා කර ඇත. ඉතිරි රුපියල් මිලියන 36.5 නව ණය යෝජනා ක්‍රමයක් දියත් කිරීමෙන් පසු යෙදවීමට නියමිතය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් එවන ලද ගිවිසුම් කෙටුම්පත නීතිමය සහ අනුකූලතා මතය සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ අනුව 2024.10.31 හෝ ඊට පෙර නව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ. | අරමුදල් භාවිතයට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **I. වෙනත් අත්තිකාරම් ගෙවුම් (140105240)**<br>2018 වසරේ සිට විගණන විමසුම් හරහා අඛණ්ඩව වාර්තා කළද පහත අත්තිකාරම් ගෙවීම් වසරකට වඩා ගිණුම්වල නිෂ්කාශනය නොවී පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, දිගුකාලීන හිඟ අත්තිකාරම් ගෙවීම් ශේෂයන් නිෂ්කාශනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් අතර විගණනය කරන ලද දිනය වන 2024 මාර්තු 18 වන දින දක්වා නොවෙනස්ව පැවතුණි. විස්තර පහත දක්වා ඇත. | i, ii, iii, iv, v, vi. අදියර 3 හි බඳවාගැනීම් සහ වෘත්තීය ද්වාර මොඩියුලය සහ අදියර 4 හි "ඉගෙනුම් කළමනාකරණය" මොඩියුලය සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත්, අදියර 3 හි "එච්ආර් ව්‍යාපාර බුද්ධිය සහ වාර්තාකරණ" මොඩියුලය සහ අදියර 4 හි "සේවක කාර්ය සාධන කළමනාකරණය" මොඩියුලය තවමත් සම්පූර්ණ කර නොමැත. මෘදුකාංග විකුණුම්කරු සමඟ | නියමිත වේලාවට ව්‍යාපෘති අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒ අනුව ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් ගිණුම නිෂ්කාශනය කරන්න. |

| | දිනය | ගෙවීම් විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| i. | 09/11/2016 | අත්තිකාරම් ගෙවීම් එච්ආර් පද්ධති පිරිවැය 3 අදියරය | 354,545 |
| ii. | | මූලික ගෙවීම් එච්ආර් පද්ධති 4 අදියරය | 434,545 |
| iii. | 15/12/2017 | 20% අත්තිකාරම් ගෙවීම් එච්ආර් පද්ධති 4 අදියරය | 434,545 |
| iv. | 26/07/2018 | 20% අත්තිකාරම් ගෙවීම් එච්ආර් පද්ධති 3 අදියරය | 354,545 |
| v. | 17/07/2019 | 20% අත්තිකාරම් ගෙවීම් එච්ආර් පද්ධති එස්ආර්එස් 4 අදියරය | 434,545 |
| vi. | 20/04/2020 | එච්ආර් පද්ධති මෘදුකාංග ස්ථාපනය 3 අදියරය | 354,545 |
| vii. | 01/12/2016 | අත්තිකාරම් ගෙවීම් තොග පාලන මෘදුකාංග පද්ධතිය | 310,000 |
| viii. | 15/12/2017 | 20% අත්තිකාරම් ගෙවීම් තොග | 310,000 |

ඇති ගිවිසුමට අනුව, සම්පූර්ණ ගෙවීම් කළ යුත්තේ එක් එක් අදියරෙහි සියලුම මොඩියුල සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. එක් එක් මොඩියුලයේ සම්පූර්ණ ගෙවීමෙන් පසු, මොඩියුලයේ පිරිවැය අත්තිකාරම් ගෙවීමේ ගිණුමෙන් අනුරූප වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

vii, viii, ix, x. "ඉන්වෙන්ටරි පාලන පද්ධතියේ" අවසාන නිකුතුව 2024 ජූලි 02 දින නිෂ්පාදන පද්ධතියට යොදවන ලදී. පද්ධතිය දැන් මාස 3ක වගකීම් කාලයක් යටතේ ක්‍රියාත්මක වේ. වගකීම් කාලයෙන් පසු, අත්තිකාරම් ගෙවීමේ ගිණුමේ ඇති මුදල් අදාළ වත්කම් ගිණුමට මාරු කළ හැකිය.

xi සීබීඑස් සීආර් සම්පූර්ණ කර ඇති අතර සීආර් සඳහා සම්පූර්ණ පිරිවැය 2024.08.20 දින "පරිගණකකරණ වියදම්" වෙත මාරු කර ඇත.

xii කිවුආර් ව්‍යාපෘතියේ 01 අදියර 2021 දෙසැම්බර් සිට සජීවීව ක්‍රියාත්මක වේ. 02 අදියර සඳහා, යොදවා ඇති යෙදුම සඳහා පරිශීලක දෙපාර්තමේන්තුව තවමත් යූඒටී (පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ) තහවුරු කිරීම අවසන් කර නොමැත. යූඒටී සම්පූර්ණ කර රැකියා අවසන් කිරීමේ වාර්තාව ලැබුණු පසු, අත්තිකාරම් ගෙවීම ඉවත් කරනු ලබන අතර, වත්කම් ගිණුමට මුළු වියදම් එකතු කරනු ලැබේ.

xiii. මෙම ව්‍යාපෘතිය යටතේ සපයා ඇති එස්එම්එස් ගේට්වේ 2022 ජනවාරි සිට සජීවීව ක්‍රියාත්මක වේ. දැනට, සීබීඑස්, ඩී2ඩී, කිවුආර්, ජස්ට් පේ සහ ඒටීඑම් එස්එම්එස් ඇඟවීම් ඇතුළුව බැංකුවේ එස්එම්එස් ඇඟවීම් පද්ධතිය හරහා යවනු

| | | | | |
|---|---|---|---|---|
| | | පාලන මෘදුකාංග පද්ධතිය - 2 වන ගෙවීම | | ලැබේ. බෙදා හැරිය හැකි අයිතම දෙක, එස්එම්එස් බැංකුකරණය සහ මල්ටි ටෙල්කො පහසුකම් විකුණුම්කරු විසින් ලබා දී නොමැත. පරිශීලකයින් මෙම |
| ix. | 15/12/2017 | 20% අත්තිකාරම් ගෙවීම් තොග පාලන මෘදුකාංග පද්ධතිය - 3 වන ගෙවීම | 310,000 | විශේෂාංගවල සාර්ථක බෙදාහැරීම සත්‍යාපනය කළ පසු, අවසාන ගෙවීම සැකසෙනු ඇත. මෙම සන්දිස්ථාන දෙකම 2024 වසර අවසානය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.<br>තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතිය |
| x. | 30/12/2020 | 20% අත්තිකාරම් ගෙවීම් තොග පාලන මෘදුකාංග පද්ධතිය - 4 වන ගෙවීම | 310,000 | සහ ඊකියා අවසන් කිරීමේ වාර්තාව සම්පූර්ණ කිරීමෙන් පසු අත්තිකාරම් ගෙවීම ඉවත් කර වත්කම් ගිණුමට සම්පූර්ණ වියදම් එකතු කරනු ලැබේ. |
| xi. | 09/06/2020 | සීබීඑස් සීආර් වෙනස්කම් අත්තිකාරම් 50% | 1,175,498 | |
| xii. | 02/07/2021 | 20% අත්තිකාරම් ගෙවීම් ගිවිසුම් අත්සන් කිරීමේ අදියරය හා 10% අත්තිකාරම් ගෙවීම් ජීඒපී සමාලෝචනය හා එස්ආර්එස් ප්‍රලේඛණය | 3,780,000 | |

| | | | |
|---|---|---|---|
| xiii. | 22/12/2021 | 10% අත්තිකාරම් ගෙවීම් එම්එස් ගේට්වේ සොලූෂන් | 625,000 |
| | **Total** | | **9,187,768** |

II. 2023 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ පහත සඳහන් දිගුකාලීන හිඟ ණය සහ ලැබිය යුතු ශේෂයන් නිරීක්ෂණය කරන ලදී.

| ජීඑල් අංකය | ගිණුම් අංකය | 31/12/2023 දිනට ශේෂය (රු.) | ශාඛාව | වර්ෂය |
|---|---|---|---|---|
| 13012010 5 | ලැබිය යුතු පොලී දිවිනැගුම එස්ඊ ණය | 2,358,872 | ප්‍රධාන කාර්යාලය | 2013 |
| 13012513 0 | ලැබිය යුතු පොලී උකස් ණය වාණිජ | 604 | දික්වැල්ල, මිහින්තලේ | 2017 |
| 23016527 0 | ලැබිය යුතු පොලී කල්ඉක්මවූ ඕ/ඒ කල්බදු | 308,877 | අනුරාධපුර, හිඟුරක්ගොඩ, කදුරුවෙල | 2016 |
| 11610010 0 | ප්‍රාදේශිය බැංකු ණය | 3,186,813 | වරකාපොල, සෙන්කඩගල, විල්ගමුව, ඌව, අලව්ව, ඉබ්බාගමුව, මිහින්තලේ, අනුරාධපුර, තඹුත්තේගම, ගල්නෑව, තලාව, උතුරු මැද | 2019 |
| 1161 0010 | කාර්ය මණ්ඩ | 12,000 | බටහිර | 2016 |

ගැටළුව නිවැරදි කිරීම සඳහා ඇල්කො වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබේ.
මෙම ගැටළු 2024.12.31 දිනට පෙර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

තවදුරටත් ප්‍රමාදයකින් තොරව දිගුකාලීන හිඟ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

| | | | | |
|---|---|---|---|---|
| 5 | ල උත්සව අත්තිකාරම | | | |
| 116100110 | ප්‍රාදේශීය බැංකු කලබදු | 1,456,584 | වැලිගම, බෙලිඅත්ත,කඹුරුපිටිය, මාතර නගර, දික්වැල්ල, වයඹ, මිහින්තලේ, අනුරාධපුර, තලාව | 2019 |
| 122100100 | කල්ඉකුත්වූ කල්බදු | 2,679,542 | තඹුත්තේගම, කහටගස්දිගිලිය, ගල්නෑව, මැදවච්චිය, පොලොන්නරුව, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ගෝණපතිරව, ගල්අමුණ, අනුරාධපුර නව නගර, කඳුරුවෙල | 2019 |
| එකතුව | | 10,003,292 | | |

III. රඳවා ගැනීමේ බද්ද (ඩබ්එච්ටී) අඩු කිරීමට අදාළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2022 දෙසැම්බර් 23 දින නිකුත් කරන ලද අංක: එස්ඊසී/2022/ඊ/03 චක්‍රලේඛයේ 7 වැනි වගන්තියට අනුව, ඩබ්එච්ටී අඩු කළ සෑම නියෝජිතයකුම ඩබ්එච්ටී අඩු කළ මාසය අවසන් වී දින 30ක් ඇතුළත ඩබ්එච්ටී සහතිකයක් නිකුත් කිරීම අවශ්‍ය වේ. එබැවින්, වෙනත් මූල්‍ය ආයතන විසින් අඩු කරන ලද පොලී මත ඩබ්එච්ටී වලට අදාළ ඩබ්එච්ටී සහතික බැංකුව විසින් එකතු කළ යුතුය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන අංක: 28 හි ලැබිය යුතු 2023 සඳහා බැංකුව විසින් කරන ලද අදාළ ආයෝජනයෙන් ඩබ්එච්ටී අඩු කළ පසු අදාළ මූල්‍ය ආයතනවලට ඩබ්එච්ටී අඩුකිරීම් සහතික යවා නැත. කෙසේ වෙතත්, ඩබ්එච්ටී සහතික ලබා ගැනීම සඳහා අදාළ මූල්‍ය ආයතන වෙත ලිපි යැවීමට කටයුතු කරමින් සිටී.

තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඩබ්එච්ටී සහතික ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

(ගිණුම් අංක: 140105155) යටතේ ඇතුළත් වූ රුපියල් 234,542,876 ක ඩබ්එච්ටී ලැබිය යුතු ශේෂයට අදාළ ඩබ්එච්ටී සහතික නොතිබුණි.

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>I. පහත දැක්වෙන පොදු ලෙජර් (ජීඑල්) ගිණුම් ශේෂයන් කිසිදු ගනුදෙනුවකින් තොරව යම් කාල සීමාවක් තුළ වගකීමක් ලෙස ඉදිරියට ගෙන ගොස් තිබුණි. විස්තර පහතින් දක්වා ඇත.
<table>
<tr><th>විස්තර</th><th>වටිනාකම (රු..)</th><th>අවසන් ගණුදෙනු දිනය</th><th>ශාඛාව</th></tr>
<tr><td>බී ඇණු ගබඩාවට යන්ත්‍රෝප කරණ ගැනීම</td><td>1,857,543</td><td>01.02.2018</td><td>ප්‍රධාන කාර්හාලය (1000)</td></tr>
<tr><td>රණවිරු දිවිනැගුම චක්‍රීය අරමුදල</td><td>213,772,526</td><td>27.03.2019</td><td>ප්‍රධාන කාර්හාලය (1000)</td></tr>
<tr><td>ගෙවිය යුතු වන්දි - එල්ඩීබී</td><td>30,781,727</td><td>25.02.2021</td><td>ප්‍රධාන කාර්හාලය (1000)</td></tr>
</table></td>
<td>2024 දෙසැම්බර් 31 දිනට පෙර ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.<br><br>රණවිරු සේවා අධිකාරිය මෙම අරමුදල ආරම්භ කළ පාර්ශ්වය වන බැවින් එම අධිකාරිය සමඟ සාකච්ඡා කර එම මුදල් යොදවා නව ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරනවා.<br><br>මෙම ජීඑල් හි ශේෂයන් එල්ඩීබී, ආර්ඩීබී සමඟ ඒකාබද්ධ කිරීමට අදාළව ඇති ඕනෑම බැඳීමක් ගෙවීම සඳහා භාවිතා කර ඇත.</td>
<td>දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ යම් වෙනස්කම් සමනය කිරීම.</td></tr>
<tr><td>II. GL 230165481-ආන්තික රුපියල් තැන්පතු ගිණුම් (එල්ඩීබී)<br>2023 දෙසැම්බර් 31 වන දිනට ශේෂය රුපියල් 15,259,234 ඉහත ගිණුමේ සටහන් කර ඇති අතර, එය එල්ඩීබී පාරිභෝගිකයින්ගෙන් ඔවුන්ගේ ණය පියවීමට ලැබුණු මුදල් නියෝජනය කරයි. කෙසේ වෙතත්, මෙම කාලසීමාව තුළ එල්ඩීබී ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් වාර්තා කිරීම සඳහා කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැති අතර, අදාළ ගිණුමේ ඇති ශේෂයන් නිෂ්කාශනය කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැත. විස්තර පහතින් දක්වා ඇත.</td>
<td>මෙම ගැටළුව 2024.12.31 දිනට පෙර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී</td>
<td>දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.</td></tr>
</table>

| ශාඛාව | වටිනාකම (රු) | අවසන් ගණුදෙනු දිනය |
|---|---|---|
| නුගේගොඩ-1350 | 13,995,000 | 16.07.2020 |
| හම්බන්තොට-2380 | 268,960 | 06.10.2021 |
| නුවර 2වන - 4350 | 19,274 | 17.07./2020 |
| වෙන්නප්පුව-7360 | 772,000 | 17.07.2020 |
| කදුරුවෙල-8210 | 204,000 | 06.09.2021 |
| **Total** | **15,259,234** | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,183,421,122 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 359,115,329ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි, රු. 824,305,793, හෙවත් සියයට 229 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයක් ප්‍රධාන හේතු වන්නේ පොලී ආදායම ඉහළ යාම සහ ගාස්තු හා කොමිස් ආදායම් ඉහළ යෑමයි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සමඟ සසඳන ලද ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල විශ්ලේෂණය පහත පරිදි වේ.

| විස්තරය | විචලනය වැඩිවීම/ (අඩු වීම) ( රු. මිලියන) | විචලනය ප්‍රතිශතය | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| ගාස්තු හා කොමිස් ආදායම් | 765.5 | 95 | සිකැඳවීම් ලිපි ගාස්තු, කිච්ආර් කොමිස්, තැපැල් ගාස්තු හා විවිධ ආදායම් වැඩිවීම |
| ශුද්ධ වෙළඳ ඉපැයීම් (අලාභ) | (337.25) | 330 | ඇ.ඩො. මිලියන 11 ක ශුද්ධ විවෘත තත්ත්වය පවත්වා ගැනීමට අදාළ ඇ.ඩො. විනිමය අනුපාතිකයේ අහිතකර චලනයන්. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

පවතින තොරතුරු අනුව, බැංකුවේ වැදගත් අනුපාතයන් සහ ආංශික අනුපාතයන් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සමඟ සැසඳීම පහත පරිදි වේ.

| | ආංශික අනුපාත (බලපත්‍රලාභී විශේෂිත බැංකුවල) ප්‍රතිශතය | 2023 ප්‍රතිශතය | 2022 ප්‍රතිශතය |
|---|---|---|---|
| <u>ලාභදායක අනුපාත</u> | | | |
| ශුද්ධ ලාභ අනුපාතය (බ.ප.ලා) | 2.97 | 1.81 | 3.73 |
| ශුද්ධ පොලී ආන්තිකය | 2.94 | 6.09 | 6.18 |
| පොලී ආදායම මත ශුද්ධ පොලී ආදායම | 18.33 | 36.65 | 44.32 |
| මුළු ආදායම මත පොලී නොවන ආදායම | 3.04 | 2.85 | 2.57 |
| පොලී ආදායම මත පොලී පිරිවැය | 81.67 | 63.35 | 55.68 |
| මෙහෙයුම් වියදම් මත පිරිස් වියදම් | 67.80 | 78.18 | 76.95 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 0.45 | 0.30 | 0.51 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ | 7.72 | 4.83 | 8.32 |
| කොටසක ඉපැයුම | | 1.54 | 2.45 |
| <u>වත්කම් තත්ත්වය</u> | | | |
| හානිකරණ ණය ( 3 අදියර) අනුපාතය (%) (අදියර 3 හානිකරණයේ ශුද්ධ) (2022 සිට) | 10.59 | 8.80 | 6.53 |
| හානිකරණ ණය ( 3 අදියර) සිට 3 අදියර ණය අනුපාතය (%) (2022 සිට) | 34.01 | 36.03 | 31.95 |
| <u>ප්‍රාග්ධන ප්‍රමාණවත්බවේ අනුපාත</u> | අවම අවශ්‍යතාවය | | |
| පොදු ප්‍රාග්ධන ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | 7 | 10.09 | 8.29 |
| මුළු ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | 8.5 | 10.09 | 8.29 |
| මුළු ප්‍රාග්ධන අනුපාතය | 12.5 | 17.28 | 15.22 |
| <u>ද්‍රවශීලතා අනුපාත</u> | | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 20 | 38.73 | 27.83 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

**3.2.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. 2023 දී ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 17 ක් වූ ණය තිස් හතක් (37) එම වසරේම නැවත ප්‍රතිලේඛණගත කර ඇත. විස්තර පහතින් දක්වා ඇත. | මුලදී, පාරිභෝගිකයා පරීක්ෂා කර පසුව ණය ගැතියන්ගේ ඉල්ලීම සහ ආපසු ගෙවීමේ හැකියාව මත පදනම්ව නැවත සැලසුම් කළ පහසුකම් සැපයීමට තීරණය කරන ලදී. | ණය ලබා දීමේ ක්‍රියාවලියට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

| වත්කම් පංතිය | ගිණුම් ගණන | ප්‍රදානය කළ ප්‍රාග්ධන එකතුව (රු.) | හිඟ එකතුව (රු.) |
|---|---|---|---|
| A0 | 16 | 10,925,000 | 10,127,572 |
| A1 | 17 | 3,230,000 | 2,881,341 |

| | | | |
|---|---|---|---|
| B0 | 4 | 3,750,000 | 3,688,866 |
| **මුළු එකතුව** | **37** | **17,905,000** | **16,697,779** |

II. 2023 දී ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 8,687 ක සමස්ථ ප්‍රදානය කළ ණය ප්‍රමාණය දාහත්දහස් තුන්සිය තුනක් (17,303) 2023 වර්ෂයේදීම ප්‍රතිව්‍යුහගත කර ඇත. විස්තර පහත පරිදි වේ.

| වත්කම් පංතිය | ගිණුම් ගණන | ප්‍රධානය කළ ප්‍රාග්ධන එකතුව (රු.) | හිඟ එකතුව (රු.) |
|---|---|---|---|
| A0 | 17,144 | 8,627,761,339 | 7,618,134,957 |
| A1 | 129 | 44,445,000 | 41,930,472 |
| B0 | 25 | 12,335,000 | 11,705,599 |
| C0 | 5 | 2,875,000 | 2,862,165 |
| **මුළු එකතුව** | **17,303** | **8,687,416,339** | **7,674,633,193** |

ගිණුම්වලින් 85%ක් ප්‍රධාන වශයෙන් ප්‍රතිමූල්‍යා ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පොලී අනුපාත වෙනස්වීම්වලට සම්බන්ධ වන අතර ඉතිරි 15% ණය කාලසීමාවේ වෙනස්වීම්, කල් පිරෙන දින වෙනස්වීම් සහ ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහයේ සැබෑ විචලනය වැනි හේතූන් මත ප්‍රතිව්‍යුහගත ණය ලෙස හඳුනාගෙන ඇත. අරමුණ සහ ගනුදෙනුකරුවන් ඉල්ලා සිටින අතර එම ණය නිතිපතා ණය ආපසු අයකර ගැනීම සඳහා සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

ණය ලබා දීමේ ක්‍රියාවලියට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

**III. පොදු ලෙජර -105100110-PB3 (014100180005589)**

ඉහත ජංගම ගිණුමේ රු.1,998,583 ක ශේෂය 2020 දෙසැම්බර් 24 දින සිට කිසිදු ගනුදෙනුවකින් තොරව හෝ ආයෝජනය සඳහා යොදා නොගෙන දිගටම පැවතුනි.

ඇල්කෝ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ජංගම ගිණුම වසා දැමීමට ක්‍රියා කරනු ඇත.

ජංගම ගිණුම් පවත්වාගෙන යාමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

IV. ණය පැහැර හැරීමකදී බැංකුවට ඇති අවදානම අවම කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමේදී බැංකුව විසින් ප්‍රමාණවත් සුරැකුම්පත් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, 2023 සැප්තැම්බර් 30 වන විට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 25 දෙනා ගේ රුපියල් මිලියන 2,426.38 දක්වා එකතු වූ හිඟ ණය වූ අතර එයින් නිශ්චල දේපළවලට එරෙහිව සුරක්ෂිත කර ඇත්තේ රුපියල් මිලියන 1,344.25 ක් පමණක් වන අතර එය මුළු හිඟ මුදලින් 55% ක් නියෝජනය කරයි. එබැවින්, හිඟ ණය මුදල් රු. මිලියන 1,082.13ක් සුරැකුම්පත්

අනාරක්ෂිත ණයවලින් 45% ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට, ධීවර සමිතියට ලබා දී ඇති ණය, ප්‍රතිඥා ණය සහ එල්ඩීබී මගින් ලබා දෙන ණය ය. ක්ෂුද්‍ර හා සාර්ව පාරිසරික සාධක සලකා බලමින් මෙම ණය ලබා

ණය ලබා දීමේ ක්‍රියාවලියට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

ශක්තිමත් නොවීම හේතුවෙන් බැංකුවට අයකර ගැනීම සැක සහිතය.

දී ඇත.

කෙසේ වෙතත්, මේ වන විට මෙම ණය ආපසු අයකර ගැනීමට බැංකුව පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව, වෙනත් රාජ්‍ය ආයතනයක් ලෙස බැංකුව විසින් රාජ්‍ය ආයතනවලට එරෙහිව මුල් අවස්ථාවේදීම නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු නොවේ. එබැවින් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර ණය මුදල ගෙවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය. තවද, ණය ගැනුම්කරුගෙන් යෝජනාවක් නොලැබුනේ නම්, ණය ආපසු අයකර ගැනීම සඳහා බැංකුව නීතිමය ක්රියාමාර්ග අනුගමනය කරනු ඇත.

එක්සත් ධීවර උදාන සකසුරුවම් හා ණය සමූපකාර සංගමය - බැංකුවේ නීති දෙපාර්තමේන්තුව දැනටමත් ණය සඳහා පවතින පුද්ගලික ඇපකර මත පදනම්ව සමිතියේ එක් එක් ණය ගැණුම්කරුවෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත.

තවද, ඔඩපන ණය තිබූ අතර, ණය ගැතියන්ගේ වංචනික ක්‍රියා

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් දැනට ගබඩාවල වී තොග නොමැත. එබැවින්, බැංකුව විසින් ණය ගැණුම්කරුවන්ට එරෙහිව අපරාධ නඩු පවරා ඇති අතර, මේ අතර, ණය ආපසු අයකර ගැනීම සඳහා නැවත කාලසටහන් ගත පහසුකම් සපයා ඇත. තවද, ණය පැහැර හැරීමේදී ණය ආපසු අයකර ගැනීමට සහ ණය අනුමත කිරීමේදී ප්‍රමාණවත් සුරැකුම්පත් ලබා ගැනීමට ඇපකරවල වැදගත්කම පිළිබඳව ශාඛා වෙත දැනුම් දී ඇත. | |
| V. | රුපියල් 5,563,554.97 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුම් සංඛ්‍යාව 5169 ක් වසර කිහිපයක් (2007 සිට) බැංකුව විසින් පොලී නොගෙවා හෝ අලුත් කිරීමකින් තොරව තබා ගෙන ඇති බව නිරීක්ෂණය විය. | ගිණුම් කිහිපයක් නිවැරදි කර ඇත. ඉතිරිය 2024.12.31 දිනට පෙර නිවැරදි කිරීමට කටයුතු කර ඇත | ස්ථාවර තැන්පතු සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| VI. | GL-210100370 - මහවැලි ණය (පැවති එල්ඩීබී) 2019 අගෝස්තු 30 වන දිනට මහවැලි ණය යෝජනා ක්‍රමයේ ශේෂය ලෙස රුපියල් 50,000,000 ක මුදලක් බැංකුව විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් (එල්ඩීබී) අත්කරපත් කර ගෙන ඇත. මෙම මුදල 2023 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව පැවති අතර එම දිනය දක්වා මෙම අරමුදලින් පාරිභෝගිකයින්ට කිසිදු ණය මුදලක් ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. | මෙම අරමුදල ප්‍රයෝජනයට ගැනීම සඳහා මහවැලි සුරකුම් නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. | ණය ලබා දීමේ ක්‍රියාවලියට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

### 3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශාඛා 05 ක් තුළ පරීක්ෂා කරන ලද ණය ලිපිගොනු නියැදි පරීක්ෂාවේ දී පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය වී ඇත.<br>• ණය ලබා දීමෙන් පසු පරීක්ෂණ වාර්තාවක් නොතිබීම.<br>• ණය අයදුම්පත කළමනාකරු විසින් | ණය ලිපිගොනු සම්බන්ධ මෙවැනි ගැටළු නිරාකරණය කිරීම සඳහා දැනටමත් ණය දෙපාර්තමේන්තුව මගින් චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. ලේඛන ආශ්‍රිත ගැටළු ණය | අනුමත බලධාරියාගේ කොන්දේසි, නිකුත් කරන ලද චක්‍රලේඛ සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව ණය ලබා දීමට සහ අයකර |

| | | |
|---|---|---|
| අත්සන් කර නොතිබුණි.<br>• ඇපකරු සඳහා 83 සහ 84 ආකෘති පත්‍ර, අවදානම් කළමනාකරණ වාර්තාව, පදිංචිය තහවුරු කිරීම, පවරා නොගැනීමේ සහතිකය, ස්ථාවර නියෝග, ආදායම් සනාථ කිරීමේ ලේඛන යනාදියේ ලේඛන නොමැතිකම හෝ අසම්පූර්ණ ලියකියවිලි පැවතීම. | ප්‍රභව පද්ධතිය (එල්ඕඑස්) හරහා විසඳනු ලැබේ. එල්ඕඑස් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ක්‍රමයෙන් දීප ව්‍යාප්තව ව්‍යාප්ත කෙරේ.<br>තවද, ණය පරිපාලන දෙපාර්තුමේන්තුව හරහා ඉහළ පරිමාණ ණය ලබා දෙන අතර එම නිසා මෙවැනි ගැටළු අවම වනු ඇත. | ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. එසේම ණය ලබා දීමට පෙර අවශ්‍ය සියලුම ලියකියවිලි ලබා ගැනීම සහ එම ලියකියවිලි වල සම්පූර්ණත්වය සහතික කිරීම අවශ්‍ය වේ. |

### 3.4. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **I. සාමාන්‍යාධිකාරී තනතුර**<br>2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 26 වැනි වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා පත් කළ යුතුය. කෙසේ වෙතත්, පසුගිය වසර පහේ ලිපි හුවමාරුව අනුව, 2019 න් පසු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 26(4) වගන්තියට අනුව අවම වශයෙන් වසර 3ක කාලයක් නිලතල දැරීමට හැකි සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියෙකු ස්ථිර පදනමින් පත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇත. විස්තර ඇමුණුම II හි දක්වා ඇත.<br>දිගු කාලීනව ස්ථිර පදනමින් පවතින සාමාන්‍යාධිකාරී තනතුරේ පුරප්පාඩුව දෛනික බැංකු කටයුතු සඳහා බලපානු ඇති බව නිරීක්ෂණය විය. | අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. කෙසේ වෙතත්, මානව හිමිකම් කොමිසමේ කරුණක් හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | බැංකු පනතේ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සඳහන් උපදෙස් පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

### 3.5. තොරතුරු පද්ධතිය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| I. පරිශීලක අක්‍රිය කිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රමාදයන්<br>ඉන්ටලෙක්ට් කෝ බැන්කින් පද්ධතිය සඳහා පරිශීලක අක්‍රිය කිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.<br>ඇමුණුම III හි විස්තර දක්වා ඇත | සසඳා බැලීම සඳහා ලබා දී ඇති ලැයිස්තුවේ 'අක්‍රිය කළ දිනය' තීරුව භාවිතා කර ඇති බව පෙනේ. මුරපදය කිහිප වතාවක් වැරදි ලෙස ඇතුළත් කළ විට ගිණුමක් අක්‍රිය කර ඇති බවට සලකුණු වේ. එබැවින්, මෙම සංසන්දනය සඳහා භාවිතා කළ යුතු තීරුව වන්නේ ලබා දී ඇති ලැයිස්තුවේ 'මකා දැමූ දිනය' ය. | අපි ලබා දී ඇති ලැයිස්තුවේ 'මකා දැමූ දිනය' තීරුව භාවිතා කර ඇත. එබැවින් පද්ධතියේ ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්න |

| | | |
|---|---|---|
| II. පෙන්නුම් කරන පරිදි ප්‍රසම්පාදන තීරණවල නිසි උපායමාර්ගික සමාලෝචනයක් නොමැතිකම නිසා එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, ශක්‍යතා අධ්‍යයනය සහ අවදානම් තක්සේරු කිරීම් සිදු නොකිරීම නිරීක්ෂණය විය.<br><br>උදා - වීසා ඩෙබිට් කාඩ්පත් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය දැනට බැංකුව විසින් ආරම්භ කර ඇතත්, සමස්ත පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, ශක්‍යතා අධ්‍යයනය සහ අවදානම් තක්සේරුව ඇතුළුව සවිස්තරාත්මක ඇගයීම් පිළිබඳ සාක්ෂි නොමැත. මේ අතර, බැංකුව විසින් නිසි ඇගයීමකින් තොරව වීසා ඩෙබිට් කාඩ්පත වෙත මාරු වෙමින් ජේසීබී ඩෙබිට් කාඩ්පත් මිලදී ගෙන ඇත. | ක්‍රියාත්මක කිරීමේදී පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය, ශක්‍යතා අධ්‍යයනය සහ අවදානම් තක්සේරුව ඇතුළත් මණ්ඩල පත්‍රිකාව අමුණා ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු එම මණ්ඩල පත්‍රිකාව අනුමත වී ඇත. එබැවින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකුවේ අරමුදල් ඵලදායි ලෙස හා කාර්යක්ෂමව භාවිතා කිරීමට සහ එවැනි ගැටළු නැවත ඇතිවීම වළක්වා ගැනීමට බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම. |

**ඇමුණුම 01**

| ණය වර්ගය | හිඟ ප්‍රාග්ධන එකතුව | හිඟ පොලී එකතුව | හානිකරණ පිරිවැය එකතුව |
|---|---|---|---|
| ලිය ඉසුර | 30,625,756 | 12,314 | 30,638,070 |
| තැන්පතු එරෙහි ණය | 13,410,935,326 | 643,361,609 | 14,054,296,935 |
| උකස් ණය | 41,292,788,532 | 3,988,314,125 | 45,281,102,657 |
| ප්‍රතිමූල්‍ය | 39,604,769,777 | 362,268,559 | 39,967,038,336 |
| කාර්යමණ්ඩල | 5,856,582,013 | 7,754,546 | 5,864,336,559 |
| කාර්යමණ්ඩල උකස් ණය | 282,666,176 | 17,722,378 | 300,388,553 |
| කාලීන ණය - කෘෂිකර්ම | 18,080,453,066 | 227,118,880 | 18,307,571,946 |
| කාලීන ණය - වාණිජ | 23,147,545,282 | 277,600,761 | 23,425,146,043 |
| කාලීන ණය - නිවාස | 43,893,563,068 | 338,825,944 | 44,232,389,013 |
| කාලීන ණය - කර්මාන්ත | 14,544,786,067 | 147,208,988 | 14,691,995,055 |
| කාලීන ණය - වෙනත් | 6,651,644,716 | 57,833,886 | 6,709,478,602 |
| කල්බදු | 856,508,495 | - | 856,508,495 |
| ණය ප්‍රධාන ගොනුවට අනුව උප එකතුව | **207,652,868,273** | **6,068,021,988** | **213,720,890,262** |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකු උකස් ණය | 18,788,200 | - | 18,788,200 |
| හස්තමය කල්බදු - එල්ඩීබී | 49,010,790 | | 49,010,790 |
| එස්එම්ආර් | 118,165,218 | - | 118,165,218 |
| හස්තමය | 3,186,814 | - | 3,186,814 |
| කාර්යමණ්ඩල උත්සව අත්තිකාරම් | 12,000 | | 12,000 |
| හස්තමය ණය එකතුව | **189,163,022** | **0.00** | **189,163,022** |
| ලැබිය යුතු පොලී කොවිඩ් 19 | | | 1,339,812,067 |

| | |
|---|---|
| 31 දෙසැම්බර් 2023 දිනට ණය ප්‍රධාන ගොනුවට හා හස්තමය ණය එකතුව | **215,249,865,351** |
| මූල්‍ය ප්‍රකාශය වල සටහන් අංක 21 ට අනුව | **215,296,266,722** |
| **වෙනස** | **-46,401,371** |

**ඇමුණුම 02**

| **නම** | **පදනම** | **බඳවාගත් දිනය** | **ඉවත් වූ දිනය** | **සේවා කාලය** |
|---|---|---|---|---|
| ටී.ඒ.ආරියපාල මහතා | ස්ථිර | 2.10.2014 | 30.01.2019 | අවු.4 මාස 3 |
| | වැඩ බලන | 01.02.2019 | 31.10.2019 | මාස 9 මාස |
| ටී.කුහන් මහතා | ස්ථිර | 01.11.2019 | 01.11.2020 | අවු.1 |
| ආර්.එම්.ඩී.කේ. රත්නායක මිය | වැඩ බලන | 02.11.2020 | 31.01.2022 | අවු.1 මාස 3 |
| ඒ.එච්.එම්.එම්.බී.ජයසිංහ මහතා | ස්ථිර | 01.02.2022 | 04.09.2022 | මාස 7 |
| පී.එස්. එදිරිසූරිය මහතා | වැඩ බලන | 05.09.2022 | 28.02.2023 | මාස 5 |
| ඒ.එච්.එම්.එම්.බී.ජයසිංහ මහතා (නැවත වාර්තා කිරීම හා ඔහුගේ තනතුරින් කලින් විශ්‍රාම යාම) | ස්ථිර | 01.03.2023 | 19.03.2023 | දින 18 |
| පී.එස්. එදිරිසූරිය මහතා | වැඩ බලන | 20.03.2023 | 05.06.2024 | අවු.1 මාස 2 |
| ඊ.ඒ.ඩී.ජනිත ප්‍රියශාන්ත මහතා | වැඩ බලන | 06.06.2024 | මේ දක්වා | |

.

**ඇමුණුම 03**

| **පරිශීලනය කරන්නාගේ නම** | **පරිශීලක අංකය** | **පරිශීලක අක්‍රිය කොඩිය** | **පරිශීලක අක්‍රිය දිනය** | **එච්.ආර්. අවසාන කළ දිනය** | **ප්‍රමාද දින ගණන** |
|---|---|---|---|---|---|
| එම්.අයි.එම්.එස්.ෆරීඩා | 010818 | ටී | 10/10/2023 | 10/9/2023 | 1 |
| ටී.එම්.කුලසේන | 010040 | එස් | 6/26/2018 | 4/28/2017 | 423 |
| එස්.එන්.ඩබ්.එම්.ජයසිංහ | 010222 | ටී | 10/17/2018 | 4/28/2017 | 536 |
| එස්.එන්.ඩබ්.එම්.ජයසිංහ | 010222 | ටී | 2/5/2020 | 4/28/2017 | 1012 |
| වී.පී.සී.ප්‍රියදර්ශනී | 011904 | ටී | 2/6/2023 | 1/30/2023 | 6 |
| ටී.එම්.කුලසේන | 010040 | එස් | 6/25/2018 | 4/28/2017 | 422 |